චක්‍රලේඛ අංක :-..11.../2014

මගේ අංකය:ඩබ්/මා.බ/2014
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014.02.11

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**සෑම වසරකම පෙබරවාරි 08 - <u>බන්ධනාගාර නේවාසික මානවක බාලදක්ෂ දිනය</u> ලෙස <u>නම් කිරීම හා මානවක බාලදක්ෂ කටයුතු සංවර්ධනය කිරීම.</u>**

බන්ධනාගාර ගත නේවාසිකයින්ගේ පුනරුත්ථාපන කටයුතු ගුණාත්මක ලෙසත්, අර්ථවත් ලෙසත් සාක්ෂාත් කරලීමේ අරමුණින් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමාගේ නව සංකල්පයක් ලෙසට බන්ධනාගාර තුල මානවක බාලදක්ෂ කටයුතු සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.ඒ යටතේ බන්ධනාගාර ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ පූර්ණ සහයෝගයෙන් යුතුව, බන්ධනාගාර නේවාසික මානවක බාලදක්ෂ කඳවුරක් 2014.02.08 සහ 09 දිනයන්හිදි නුවරඑළිය පිඩෘෘ ජාත්‍යන්තර බාලදක්ෂ ක්‍රීඩාංගනයේදී පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ඉතාමත් සාර්ථකව පැවැත්වුනි.

02. එම කඳවුරු සමාප්ති උළෙලේදී පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමා විසින් මින් ඉදිරියට සෑම වසරකම **පෙබරවාරි 08 දින බන්ධනාගාර නේවාසික මානවක බාලදක්ෂ දිනය** ලෙසට ප්‍රකාශයට පත් කරන්නට යෙදුනි.

03. එමනිසා දැනටමත් ඔබ ආයතනයේ පිහිටුවා ඇති මානවක බාලදක්ෂ කණ්ඩායම් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි ආකාරයේ විධිමත් වැඩපිළිවෙලක් ඔබගේ පුද්ගලික අවධානය යටතේ ක්‍රියාත්මක කල යුතුය.මේ සඳහා ඔබ ආයතනයේ සේවය කරන පුහුණු බාලදක්ෂ නිළධාරීන් යොදාගැනීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙමි.

04. ඔබ ආයතනයේ පැවැත්වෙන විවිධ ආයතන අවශ්‍යතා සඳහා ත් විශේෂ උත්සව අවස්ථා සඳහාත්, ආයතනයේ බාහිර කටයුතු සඳහාත්, මෙම බාලදක්ෂ කණ්ඩායම් වල සේවය ලබාගැනීමට ඔබ විසින් ක්‍රියාකල යුතුය.

05 නේවාසික බාලදක්ෂ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වාර්ෂිකව සිරකරු සුභසාධක අරමුදලට වැය ඇස්තමේන්තු සැකසීමේදී ඉල්ලුම් කිරීමට පුනරුත්ථාපන නිළධාරීන් විසින් වග බලාගත යුතුය.

06.බන්ධනාගාර තුල බාලදක්ෂ කටයුතු සංවර්ධනය කිරීම හා මානවක බාලදක්ෂ දිනයේදී බාලදක්ෂ කඳවුරු සංවිධානය කිරීම බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්), බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) හා මූලස්ථාන අධිකාරී විසින් සිදු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

**<u>පිටපත්</u>**

1. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා - කා.දැ.ගැ.පි
2. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍ය ගරු සරත් චන්ද්‍රසිරි මුතුකුමාරණ මැතිතුමා - කා.දැ.ගැ.පි
3. ලේකම් - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය - කා.දැ.ගැ.පි
4. අතිරේක ලේකම්(සංවර්ධන) පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය - කා.දැ.ගැ.පි
5. බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) - බන්ධනාගාර මූලස්ථානය - කා.දැ.ගැ.පි සහ අ.ක.ස
6. බන්ධනාගාර කොමසාරිස්(පුනරුත්ථාපන)- බන්ධනාගාර මූලස්ථානය - කා.දැ.ගැ.පි සහ අ.ක.ස
7. බන්ධනාගාර මූලස්ථාන අධිකාරී - බන්ධනාගාර මූලස්ථානය - කා.දැ.ගැ.පි සහ අ.ක.ස